*Summaries in Sinhala*
*Intervention 2008, Volume 6, Number 1, Page 88 - 89*

# Summaries in Sinhala

**ප්‍රජා-මූල මනෝ සාමාජීය වැඩසටහන් ඇගයීම සඳහා නීදේශ**

අප්‍රේල් 27වන දින යුද්ධය සහ ත්‍රස්තවාදය නිසා බලපෑමට ලක්වූ ප්‍රදේශ තුළ ප්‍රජා මූල මනෝ සාමාජීය වැඩසටහන් ඇගයීම පිළිබඳ නේටෝ උසස් පර්යේෂණ වැඩමුළුවේ යෝජිත නීදේශයන් 21 මෙම ලිපිය තුළින් වර්තා කර යි. තවද අගයන්නන් වටිනාකම්, සාක්ෂි සහ ඔවුන්ගේ අත්දැකීම් සහ වැඩසටහන ක්‍රියාත්මක කරන්නනගේ සැලසුම් කිරීමේ සහ දියත්කිරීමේ අත්දැකීම් සම්බන්ධ කරගන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩමුලුවේ එකඟතාවයන් සාරාංශ ගතකර යි.

---

**මනෝ සාමාජීය ව්‍යාපෘති වල ඇගයීම් දීශක වර්ධනය වීම: නිර්මාණශීලි අභියෝගයන් සහ පර්යේෂණයන් ගේ නොවෙනස්වන සුළුභාව අතර සමතුලිතබව**

සාමාන්‍යයෙන් විවිධ උනන්දූන් දක්වන්නන් මනෝ සාමාජීය ව්‍යාපෘතීන් සඳහා උනන්දුවක් දක්ව යි. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සහ කළමණාකරු, ආධාරක ආයතන, බලධාරීන්, ප්‍රතිලාභීන් සහ ප්‍රජාව මේ අතර දැක්විය හැක. සමහර විටෙක මොවුන්ගේ උනන්දූන් එකිනෙකට පරස්පර විය හැකි වූවද මෙම උනන්දූන් පිළිබඳව පැහැදිලිතාවයන් ලබාගැනීම තුළින් සුසංගත එකඟතාවයන්ට පැමිණිය හැක. මූලික වශයෙන් ගත් කළ ඇගයීමක් යනු ව්‍යාපෘතියේ අනාගතය පිළිබඳව තීරණ ගන්නා උපකරණය කි. ඇගයීමක මූලික අනුමානය වනුයේ ව්‍යාපෘතියේ ඉලක්කය සහ අරමුණු වෙත ගමන්කරන බව පෙන්වාදෙන නිරීක්ෂණය කළ හැකි හෝ මැනිය හැකි බලපෑම් (විපාකයන්, ප්‍රතිඵලයන්) හඳුනාගත යුතුය යන්න යි. මෙම ක්‍රියාවලියේ තීරණාත්මක සාධකයක් වනුයේ ඇගයීම් දීශක විශ්වීය මිණුම් දඬු කිහිපයකට යටත් වෙමින් ඒවා සපුරාලිය යුතු අතරම නිශ්චිත අන්තර්ගත සහ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ඇගයීමට ලක්කරන ව්‍යාපෘතියේ සුවිශේෂතාවයන් නිරූපණය කළ යුතු ය.

**මුඛ්‍ය වචන:** ඇගයීම, මිණුම් දඬු, දීශක

---

**හදිසි අවස්ථාවන්හිදී සිදුකෙරන මනෝ සාමාජීය වැඩසටහන් ඇගයීම සඳහා යුනිසෙෆ් ආයතනය විසින් සකස් කරන ලද අත්වැල තුළින් මතුවෙමින් පවතින ගැටලු**

මෙම ලිපිය 2006දී යුනිසෙෆ් ආයතනය විසින් තම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහාම සැකසූ ඇගයීමේ අත්වැල වර්ධනය පිළිබඳව විස්තර කරයි. ඇගයීමේ ක්‍රියාවලියට අදාලව ක්ෂේත්‍රය තුළ භාවිතාවන සහ දැණුවත් ව ඇති වෙනස්වන පර්යාවලෝකනයන් මොනවාද යන්න අනාවරණය කරමින් මෙම අත්වැල සැකසීමේ උපදේශන ක්‍රියාවලිය සාකච්ඡාවට ලක් කරයි. පොදු සෞඛ්‍ය සඳහා මේල්මන් පාසැල විසින් කරන ලද සමාලෝචනය මත පදනම් ව ඇගයීමේ සැකසුම සහ ක්‍රමවේදය පිළිබඳ පුළුල් සොයාගැනීම්ද සාකච්ඡාවට ලක් කරයි. මෙම ලිපිය මූලිකවම නිමැවැම්, ප්‍රතිඵල සහ බලපෑම් තලයන්වල දීශක හැඳින්වීමේ දී මනෝ සාමාජීය යහපැවැත්ම සංකල්පගතකර ඇති ආකාරය සලකා බල යි. දෙවැනුව සංකීර්ණ හදිසි තත්වයන්හිදී මෙම ක්‍රමයන් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව යෝගැනීමේදී මුහුණපාන අභියෝගයන් පැහැදිලි කිරීමට සිද්ධි අධ්‍යයනයන් පරීක්ෂා කරඇත. තෙවැනුව මෙම ලිපිය තුළින් 'පර්යේෂණයක් ලෙස ඇගයීම' සහ 'යථාර්ථයක් ලෙස ඇගයීම' යන දෙක අතර ඇති ආතතිය සලකා බලමින් ක්ෂේත්‍රය තුළ ඇති සාපේක්ෂ වටිනාකම් සාකච්ඡාවට ලක් කර යි.

**මුඛ්‍ය වචන:** ඇගයීම, මනෝ සාමාජීය වැඩසටහන්, හදිසි තත්වයන්



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

**අවි ගැටුම් වලින් බලපෑමට ලක්වන ළමයින් සඳහා මානසික සෞඛ්‍ය මැදිහත්වීම්වලට සාක්ෂි පදනමක් ගොඩනැගීම**

මෙම ලිපිය තුළින් අවි ගැටුම් වලින් බලපෑමට ලක්ව ඇති ළමුන් සහ යෞවනයන් ගේ මානසික සෞඛ්‍ය ගැටලු ආමන්ත්‍රණය කිරීමේ මැදිහත්වීම්වල ප්‍රතිපලීයකත්වය දැනට පී යේෂණයන් තුළින් අනාවරණය කර අති දැනුම පදනම් කරගනිමින් සමාලෝචනය කර යි. ක්ෂෙත්‍රය තුළ ප්‍රධානත්වයක් ගන්නා ප්‍රධාන මැදිහත්වීම් ආදීශයවන් දෙකක් වන මනෝ සාමාජීය ප්‍රවේශයන් සහ සායනික/මනෝචිකිත්සක ප්‍රවේශයන් මෙහිදි සාකච්ඡාවට ලක් කරයි. මෙම ප්‍රවේශයන් දෙක පිළිබඳව ඇති මූලික කියවීම්, න්‍යායන්, තක්සේරු කිරීමට පදනම් වූ න්‍යායන්, වැඩසටහන් සැලසුම්කිරීම, නිරීක්ෂණයන් සහ ඇගයීම් මෙම ලිපියේදී සමාලෝචනයට ලක් වේ.

අවි ගැටුම්වලින් බලපෑමට ලක්ව ඇති ළමයින්ගේ මානසික සෞඛ්‍ය මැදිහත්වීම් පිළිබඳ සාක්ෂි පදනමක් ගොඩනැගීමට අනාගත පීයේශනයන් ට අවශ්‍ය වන්නේ මොනවද යන්න සාකච්ඡාවට ලක්කරමින් ලිපිය අවසන් කර යි.

**මුඛ්‍ය වචනඃ** ළමුන්, මානසික  ෟඛ්‍ය අවි ගැටුම්, මානසික සෞඛ්‍ය මැදිහත්වීම්, උගැන්ඩාව

---

**අවි ගැටුම් පවතින ප්‍රදේශයන්වල මනෝ සාමාජීය වැඩසටහන් ඇගයීමේ විද්‍යාත්මක නොවන බාධාවන් සමහර බාධාවන්ඃ ක්ෂෙත්‍ර නිළධාරියෙකුගේ ඇසින්**

ක්ෂෙත්‍රය තුළ ඇති පුළුල් අත්දැකීම් මත පදනම් ව තක්සේරු කරන ලද ප්‍රතිලාභී කණ්ඩායම් තුළ ඇගයීමට ඇති නොකැමැත්ත පිළිබඳව සිද්ධි අධ්‍යයනයක් ලේඛකයා ඉදිරිපත් කර යි. බාහිර අගයන්නන් හෝ ඇගයීම් කිරීමේ ස්වරූපයෙන් පෙනී සිටින්නන් නිසා මතු වෙන මනෝවිද්‍යාත්මක ක්‍රියාවලිය සහ ක්ෂෙත්‍ර නිලධාරීන් අතර අපහසුතාවයන් නිර්මාණය කිරිම පිළිබඳව මෙම ලිපිය සාකච්ඡා කරයි. සමහරක් ඇගයීම් ක්‍රමයන්ට ඇති සංස්කෘතික පිළිගැනීම මෙහිදී අවධානයට යොමු කෙරේ. මෙහිදී ඇගයීම් නිර්මාණකරුවන් සහ ඇගයීම් වෘතාවන් හෝ පීයේශනයන් ප්‍රකාශකරන්නන්ගේ ආචාර ධර්ම සහ සමාජ වගකීම් යන ගැටලුව ඇගයීම් දත්ත පදනම් කරගනිමින් ඉදිරිපත් කර යි. ඇගයීම සහ පීයේෂණය අතර ඇති සම්බන්ධතාවය මෙම ලිපිය තුළින් ආමන්ත්‍රණය කර ඇත.

**මුඛ්‍ය වචනඃ** සංස්කෘතික පිළිගැනීම, ඇගයීම, ආචාර ධර්ම

**මුඛ්‍ය වචනඃ** ළමා අයිතිවාසිකම්, ඇගයීම

**ප්‍රජා මූල මනෝ සාමාජීය වැඩසටහන් ඇගයීමඃ ඇයි? කුමක්ද? සහ කෙසේද?**

විවිධ හේතුන් නිසා මනෝ සාමාජීය වැඩසටහහන් ඇගයීම් ක්‍රියාත්මක කළ හැකි අතර මෙම හේතුවේ ස්වභාව විසින්ම ඇගයීමට ලක්කරන්නේ කුමක්ද යන්න මෙන්ම කුමන මිණුම් දඬු සහ ක්‍රමයන් යෝ ගත යුතුද යන්නද තීන්දු කරයි. මෙම ලිපිය ඇගයීම යන්නට අවධාරණය යොමු කරන්නේ ම අත්දැකීම් සහ ඒධනය වී ඇති විශේෂඥ දැනුමින් උකහා ගැනීම සඳහා ය. මෙම ලිපිය තුළ සමහරක් ඇගයීම් මිණුම් දඬු සාකච්ඡාවට ලක් කර ඇති අතර පියවරෙන් පියවර සැලසුම් කරගන්නා අයුරු ද පැහැදිලි කර යි.

**මුඛ්‍ය වචනඃ** ඇගයීම් මිණුම් දඬු, ප්‍රතිපලී යකත්වය, බලපෑම, දීශක



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.